මහා පාපකම් අතරින් මහත්ම පාපකම් වනුයේ: අල්ලාහ්ට ආදේශ තැබීම, අල්ලාහ්ගේ සැළසුම ගැන නිර්බිය වීම, අල්ලාහ්ගේ කරුණාව ගැන බලාපොරොත්තු නැතිකර ගැනීම හා අල්ලාහ්ගේ ප්රාණය ගැන අනපේක්ෂිත වීම.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “මහා පාපකම් අතරින් මහත්ම පාපකම් වනුයේ: අල්ලාහ්ට ආදේශ තැබීම, අල්ලාහ්ගේ සැළසුම ගැන නිර්බිය වීම, අල්ලාහ්ගේ
කරුණාව ගැන බලාපොරොත්තු නැතිකර ගැනීම හා අල්ලාහ්ගේ ආත්මය ගැන අනපේක්ෂිත වීම.”
[මෙහි වාර්තා සම්බන්ධතාව පූර්ව සාධක සහිතය] [අබුදර් රස්සාක් එය වාර්තා කර ඇත]

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මෙම හදීසයේ මහා පාපකම් ලෙස සැලකෙන ඇතැම් පාපකම් ගැන මෙනෙහි කර ඇත්තාහ. ඒවානම්: අල්ලාහ්ගේ පාලනයේ හෝ ඔහුගේ දේවත්වයෙහි හෝ ඔහුට හවුල්කරුවකු පත් කොට එවැන්නකු මගින් කටයුතු ආරම්භ කිරීම. සැබැවින්ම එය බරපතල පාපයකි. අල්ලාහ් පිළිබඳ බලාපොරොත්තු හා අපේක්ෂාවන් ගැන බිඳ දැමීම. සැබැවින්ම එය අල්ලාහ් පිළිබඳ නපුරක් සිතීම හා ඔහුගේ කරුණාවේ විශාලත්වය ගැන අනවබෝධය පෙන්වා දෙයි. ගැත්තා නොසැළිකිලිමත්ව සිටියදී ඔහුව ග්රහණය කරන තෙක් ආශිර්වාද තුළින් ඔහුව පියවරෙන් පියවර හසු කිරීම ගැන නිර්බිය වීම. මහාපාපකම් අධිකව පවතින බැවින් මෙහි සඳහන් කරන ලද මහා පාපකම් සීමා කිරීමක් හදීසයෙන් අපේක්ෂා නොකෙරේ. නමුත් එම මහා පාපකම් විස්තර කිරීමක් අපේක්ෂා කෙරේ.

https://sunnah.global/hadeeth/si/show/6049